# චිත්ත හා චිත්තක්ෂණ

කාලය හා අවකාශය සම්බන්ධයෙන් සමමිතියක් පැවතීම අනිවාර්ය නො වෙයි. අයින්ස්ටයිනීය සාපේක්ෂතාවාදයෙහි වුව ද ඒ සමබන්ධයෙන් දෘඪ සමමිතියක් නැත. එසේ වුව ද යම් නිරීක්ෂකයකුගේ අවකාශ ප්‍රාන්තරයක් තවත් නිරීක්ෂකයකුගේ කාල ප්‍රාන්තරයක් විය හැකි ය. අපි අවකාශයෙහි A නම් නිරීක්ෂකයකුට සාපේක්ෂව චලනයවන P නම් අංශුවක් ගනිමු. අංශුව A ට සාපේක්ෂව චලනය වුව ද අංශුවට සාපේක්ෂව එය ඇත්තේ නිශ්චලතාවයෙහි ය. අංශුවට සාපේක්ෂ ව අංශුවේ අවකාශ ප්‍රාන්තරය සැම විටෙක ම ශූන්‍ය වෙයි. අංශුවට සාපේක්ෂව ගත්කල අංශුවේ වෙනස්වන්නේ කාලය පමණකි. එහෙත් A ට සාපේක්ෂ ව අංශුවෙහි කාලය පමණක් නොව අවකාශයෙහි එයට ඇති දුර ද වෙනස් වෙයි. අයින්ස්ටයිනීය සාපේක්ෂතාවාදයට අනුව මේ අවකාශ ප්‍රාන්තර හා කාල ප්‍රාන්තර අතර යම් සම්බන්ධයක් වෙයි. අවකාශ ප්‍රාන්තරයෙහි වර්ගය හා කාල ප්‍රාන්තරයෙහි වර්ගය එකක් අනෙකෙන් අඩුකිරීමෙන් අවකාශ-කාල ප්‍රාන්තරය නමින් හැඳින්වෙන්න ලැබෙයි. එසේ අවකාශ-කාල ප්‍රාන්තරය ගණනය කිරීමේ දී එකක් අනකෙන් අඩුකිරීමට සිදුවීමෙන් පෙන්නුම් කෙරෙන්නේ අවකාශය හා කාලය සම්බන්ධයෙන් දෘඪ සමමිතියක් නොතිබෙන බව ය. එවැනි දෘඪ සමමිතියක් තිබිණි නම් අපට ඒ වර්ග එකතුකිරීමට සිදුවනු ඇත.

එවැනි දෘඪ සමමිතියක් නොතිබිණි ද, යමකිසි නිරීක්ෂකයකුට සාපේක්ෂ ව P හි අවකාශ ප්‍රාන්තර වෙනත් නිරීක්ෂකයකුට සාපේක්ෂ ව කාල ප්‍රාන්තර වීම ඔස්සේ ප්‍රකාශවන යම් සමමිතියක් කාලයට හා අවකාශයට වෙයි. බටහිර භෞතික විද්‍යාවේ කියැවෙන මේ සමමිතිය එහි ම ඇතැම් අවස්ථාවල උල්ලංඝනය වන බව පෙනී යයි. කලින් සඳහන්කළ පරිදි වස්තුවකට යම් ප්‍රදේශයක දිගින් දිගට ම තිබිය හැකිමුත් එකවිට ප්‍රදේශ කිහිපයක තිබිය නොහැකි ය. එහෙත් මේ අසමමිතිය විසඳන ක්‍රමයක් බෞද්ධ සාහිත්‍යහෙි සඳහන් වෙයි. ඒ වස්තුවේ ඊනියා පැවැත්ම ම ප්‍රතික්ෂෙප කිරීමෙන් ය.

අපි නැවතත් ප්‍රශ්නයේ මුලට ම යමු. යම් වස්තුවක් පවතින්නේ යැයි අප කියන්නේ ඇයි? අප එලෙස වස්තුවක් පවතින්නේ යැයි ගන්නේ ඇයි? එයට හේතුව වස්තුවේ වෙනස් නොවන යමක් ගැන අපේ මනසට දැනෙන බැවින් ය. එහෙත් මනස යනු විශ්වාස කළහැකි ඉන්ද්‍රියක් නො වෙයි. අනෙක් අතට අපට යමක් නො වෙනස් ව පවතින බව දැනෙන්නේ කාලයෙහි ය. කාලය යනුවෙන් දෙයක් ඇත් ද යනු තවත් ප්‍රශ්නයකි.

ඉලෙක්ට්‍රෝනයක් වැනි අංශුවක් එක් ක්ෂණයක දී ඇතිවී නැතිවී යන්නේ යැයි සිතන්න. එමෙන් ම නැතිවන ඉලෙක්ට්‍රෝනය වෙනුවට වෙනත් ඉලෙක්ට්‍රෝනයක් ද ඇතිවන්නේ යැයි ද නැතිවන ඉලෙක්ට්‍රෝනයේ ගුණ පසුව ඇතිවන ඉලෙක්ට්‍රෝනයට ලබාදෙන්නේ යැයි ද සිතන්න. එවිට දෙවැනි ඉලෙක්ට්‍රෝනය පළමුවැනි ඉලෙක්ට්‍රෝනයෙන් වෙනස් යැයි අපි නොසිතමු. අප සිතන්නේ පළමු ඉලෙක්ට්‍රෝනය ම දිගින් දිගට ම පවතින බව ය. මෙහි දී වැදගත්වන තවත් කරුණක් වෙයි. එනම් අප ඉලෙක්ට්‍රෝනයක් යනුවෙන් අංශුවක් යම් ක්ෂණයක හෝ ගන්නේ ඇයි ද යන්න හා ඉලෙක්ට්‍රෝනය යනුවෙන් අංශුවක් එලෙස ක්ෂණයක හෝ පවතින්නේ ද යන්න ය. එමෙන් ම ඉලෙක්ට්‍රෝනය පවතින්නේ යැයි ගතහොත් එය එක් ලක්ෂ්‍යයකට පමණක් සීමා වියයුතු ද යන ප්‍රශ්නය ද වෙයි.

මෙහි දී පළමුවෙන් ම කිවයුතු කරුණ වනුයේ ඉලෙක්ට්‍රෝනය හෝ වෙනත් යමක් හෝ පවතින්නේ මනසට සාපේක්ෂ ව බව ය. මනසින් තොර ව, මනසෙන් ස්වායත්ත ව යමක් පවතින බව මනසින් තොරව පෙන්වා දිය නොහැකි ය. ඉලෙක්ට්‍රෝනයක් හෝ වෙනත් අංශුවක් හෝ වස්තුවක් පවතින බව පෙන්වාදීමට කරන උත්සාහයක මනස විසින් නිර්මාණය කෙරී ඇති නොයෙකුත් සංකල්ප යොදාගැනීමට සිදුවෙයි. අපි තවත් අයකුට යමක් තේරුම් කරදීමේ දී වචන යොදාගනිමු. මේ වචන පිටුපස ඇත්තේ සංකල්ප ය. වචන නොමැතිව චිත්‍රයක් හෝ සංගීත ඛණ්ඩයක් මගින් යමකුට යමක් සංනිවේදනය කළ ද ඒ චිත්‍රය හෝ සංගීත ඛණ්ඩය ද සංකල්පයක හෝ සංකල්පවල හෝ ප්‍රතිඵල වෙයි. එපමණක් නොවෙයි. අපි අපට ම යමක් තේරුම්කරදීමේ දී ද සංකල්ප යොදාගනිමු. ඒ සියළු සංකල්ප නිර්මාණ වෙයි. එනම් මනසෙහි නිර්මාණ වෙයි. සංකල්ප සංස්කරණය කිරීම ම මනසෙහි කාර්යය වෙයි. මනස යන සංකල්පය ද මනසෙහි ම නිර්මාණයක් වෙයි. වැඩි විස්තර සඳහා “මගේ ලෝකය” පොත කියවන්න.

© Prof. Nalin De Silva

අනිත්‍ය දුක්ඛ අනාත්ම අනවබෝධය හේතුවෙන් අපි දැනුම සංස්කරණය කරමු. ඉලෙක්ට්‍රෝනය යන්න ද අපේ මනස විසින් නිර්මාණය කෙරෙන්නක් වෙයි. අප විසින් ඉලෙක්ට්‍රෝනය හෝ වෙනත් යමක් තේරුම්ගනු ලැබීමේ දී අපි දැනුම නිර්මාණය කරන්නෙමු. එලෙස යම් වස්තුවක් පවතින්නේ යැයි ගැනීම ද තේරුම් ගැනීමක් හා නිර්මාණයක් වෙයි. ඉලෙක්ට්‍රෝනය සඳහා මෙහි මතු දැක්වෙන ආකෘතිය ද නිර්මාණයක් වෙයි. දැනුම නිර්මාණයේ දී සිදුවන ප්‍රධාන දෙයක් නම් එලෙස නිර්මාණය කෙරෙන දැනුම නිර්මාණය කෙරී ඇති අනෙක් දැනුම් සමග හැකිතාක් පරස්පරවලින් තොරව සංගත ව නිර්මාණය කෙරීම ය.

අපේ මනසට ගතහැකි කුඩා ම කාල පරිච්ඡේදයක්, කාල ප්‍රාන්තරයක් වෙයි. මෙයින් කියැවෙන්නේ කාලය යනුවෙන් යමක් පවතින බව හා අපට ඉන් ඉතා කුඩා ම කොටසක් මනසින් ග්‍රහණය කරගත හැකිය යන්න නො වෙයි. කාලය යන සංකල්පය ද නිර්මාණය කෙරෙන්නේ මනස විසින් ය. පුටුව වැනි සංකල්පයක් මනස හා අනෙක් ඉන්ද්‍රියවල එකතුවෙන් නිර්මාණය කෙරුණ ද කාලය යන්න අනෙක් ඉන්ද්‍රියන්ගේ ආධාරයක් නොමැති ව මනස විසින් නිර්මාණය කෙරෙන සංකල්පයකි. කාලය යනු පඤ්ඤත්තියක් යැයි අභිධර්මයෙහි ධම්මසංගණියට බුද්ධඝෝෂ හිමියන් විසින් ලියන ලද අටුවාව වූ අත්ථසාලිනියෙහි සඳහන්වෙයි. ඒ ගුරුකොටගෙන අනෙක් ඉන්ද්‍රියන්ගේ ආධාරයක් නොමැතිව මනස විසින් නිර්මාණයකෙරෙන සංකල්පවලට අපි පඤ්ඤත්තීන් යැයි කියමු.

අපේ මනසට ගතහැකි කුඩා ම කාල පරිච්ඡේදයක් වේය යන්නෙහි තේරුම නම් මනසට නිර්මාණය කළ හැකි කුඩා ම කාල පරිච්ඡේදයක් වේය යන්න ය. එයට වඩා කුඩා කාල පරිච්ඡේදයක් ගැන මනසට සිතිය නො හැකිවෙයි. මනසට එයට වඩා කුඩා කාල පරිච්ඡේදයක් ග්‍රහණය කිරීමට නො හැකි ය. සිංහල ථෙරවාද බුද්ධාගමෙහි චිත්තක්ෂණය යනුවෙන් හැඳින්වෙන්නේ මේ කුඩා ම කාල පරිච්ඡේදය යැයි සිතමි. මේ චිත්තක්ෂණය යනු චිත්තයක් ඇති වී පැවතී භංගවීමට ගතවන කාල පරිච්ඡේදය වෙයි. චිත්තක්ෂණයක් තුළ චිත්තයක් ඇති වී නැති වී යන්නේ ය යන්නෙහි තේරුම චිත්තයක් ඒ ක්ෂණය තුළ නොවෙනස් ව පවතින්නේ ය යන්න නො වෙයි. චිත්තයක් ඇතිවන්නේය යන්න ද මනසෙහි ම නිර්මාණයක් වෙයි. චිත්ත ද මනසේ ම නිර්මාණ වෙයි.

මනස විසින් නිර්මාණය කෙරෙන මේ චිත්තය ද වෙනස්වෙයි. එය චිත්තක්ෂණයක ඇතිවී වෙනස්වී නැතිවෙයි. භංගවන්නේ ඇතිවූ චිත්තය නො වෙයි. ඒ එක් අතකින් ගත්කල වෙනස් චිත්තයකි. එහෙත් එලෙස වෙනස් චිත්තයක් ලෙස ගැනීමට නම් මුල් චිත්තය ඒ දෙවනුව ඇතිවූ චිත්තයට කලින් නැතිවිය යුතු ය. එනම් චිත්තක්ෂණයට ද කුඩා කාල පරිච්ඡේදයක් මනසට ගතහැකි වියයුතු ය. ඒ කුඩා කාල පරිච්ඡේදය තුළ ඇති වී නැතිවන චිත්තය ද වෙනස් වෙයි. එවිට ඒ චිත්තය සම්බන්ධයෙන් ද කලින් කී දේ කීමට හැකිවිය යුතු ය. එනම් ඒ චිත්තය ද එයටත් කුඩා කාලයක දී නැතිවිය යුතු ය යන්න ය. මෙලෙස චිත්ත පවතින කාල පරිච්ඡෙද කුඩාකරමින් තව තවත් කුඩා කාල පරිච්ඡෙද නිර්මාණයකිරීමට මනසට හැකිවිය යුතු ය. මෙහි කෙළවරක් නොතිබිය හැකි ය. එහි තේරුම නම් මනසට ශූන්‍යවූ කාල පරිච්ඡෙදයක් ද නිර්මාණය කළ හැකි බව ය. එහෙත් එවැනි කාල පරිච්ඡෙදයක දී චිත්තයක් ඇතිවී නැතිවීම ම අර්ථ ශූන්‍ය ප්‍රකාශයක් වෙයි. අනෙක් අතට එවැනි ක්ෂණයක් නිර්මාණයකිරීමට ද මනස අපොහොසත් වෙයි.

මේ සියළු කරුණුවලින් පෙනී යන්නේ මනසට ගතහැකි කුඩා ම කාල පරිච්ඡේදයක් ගැන අපට සඳහන්කළ හැකි බවත් ඒ ක්ෂණය චිත්තක්ෂණය ලෙස නම්කළ හැකි බවත් ය. මේ චිත්තක්ෂණය යන්න ද මනසෙහි නිර්මාණයක් බව අමතක නොකළ යුතු ය. චිත්තක්ෂණයක ඇතිවී වෙනස්වී නැතිවී යන්නේ චිත්තයක් යැයි අපි කියමු. මේ මනසින් අනිත්‍ය තේරුම්ගැනීමට යෑමේ දී හමුවන සීමාව ය. අනිත්‍ය මනසින් තේරුම්ගතහැකි නො වෙයි. චිත්තක්ෂණයක දී චිත්තයක් පවතින්නේ යැයි කීව ද එය නිවැරදි නොවන්නේ ඒ ක්ෂණයෙහි චිත්තය වෙනස්වන බැවිනි. මෙවැනි අවස්ථාවල දී අපට චතුස්කෝටික න්‍යාය පිහිටවෙයි. අපට කිවහැක්කේ චිත්තක්ෂණයක චිත්තය පවතින බව මෙන් ම නොපවතින බව ය. වෙනත් ආකාරයකින් කියන්නේ නම් චිත්තය චිත්තක්ෂණයෙහි වෙනස්වන බව ය.

ඉහත සඳහන් කරුණු එක්වර තේරුම්ගතහැකි යැයි නො සිතමි. එබැවින් ඒ නැවත සාරාංශයක් ලෙස ඉදිරිපත්කෙරෙයි. අපේ මනසට ගතහැකි කුඩා ම කාල පරිච්ඡේදයක් වෙයි. ඒ කාල පරිච්ඡේදයට චිත්තක්ෂණයක් යැයි කියනු ලැබෙයි. ඒ චිත්තක්ෂණය යන්න ද මනසෙහි ම නිර්මාණයක් වෙයි. මේ කාල පරිච්ඡේදයෙහි ඇතිවී වෙනස්වී

© Prof. Nalin De Silva

නැතිවන චිත්තයක් අපි නිර්මාණය කරමු. ඒ චිත්තය නැති වීමෙන් පසු වෙනත් චිත්තයක් උපදින්නේ යැයි අපි කියමු. චිත්ත මෙන් ම චිත්තක්ෂණ ද අපේ නිර්මාණ වෙයි.

දැන් ප්‍රශ්නය වනුයේ මනස යනු කුමක් ද යන්න ය. චිත්ත හා චිත්තක්ෂණ මනසෙහි නිර්මාණ වේ යැයි සඳහන් කෙරුවෙමු. එසේ නම් ඉන් කියැවෙන්නේ අනෙක් සියල්ල නිර්මාණය කරන මනස නමින් වූ යම් කිසිවක් පවතින බව ද? එයට පිළිතුර නැත යන්න ය. මනස ද මනසෙහි නිර්මාණයකි! එසේ නම් මනස විසින් මනස නිර්මාණය කෙරෙන්නේ කෙසේ ද ? ඒ සඳහා ද ප්‍රවාදයක් අවශ්‍ය වෙයි.

එහෙත් එයට පළමුව කිවයුත්තක් වෙයි. චිත්තක්ෂණය හා ඒ සමග බැඳුණු රූපක්ෂණ යන්න ථෙරවාදී අභිධර්මයෙහි සඳහන් සංකල්ප වෙයි. ඒ සංකල්ප නිර්මාණය කළෝ ථෙරවාදී භික්ෂූන් වහන්සේ ය. මෙහි දී කිවයුතු වැදගත් ම කරුණ නම් මෙ සම්බන්ධයෙන් සිංහල භික්ෂූන් වහන්සේගේ දායකත්වය ය. අපේ මහාවිහාරික භික්ෂූන් වහන්සේ විසින් නිර්මාණය කෙරී ඇති දැනුම අනුව රූපක්ෂණයක් හා චිත්තක්ෂණයක් අතර සම්බන්ධයක් වෙයි. උන්වහන්සේලාට අනුව රූපක්ෂණයකට චිත්තක්ෂණ දහසතක් වෙයි. මෙ ඉතා වැදගත් කරුණක් වෙයි. සිංහල ථෙරවාදී භික්ෂූන් වහන්සේ එවැනි නිගමනයකට පැමිණියේ කෙසේ දැයි අපි නො දනිමු. එසේ වුවත් එවැනි දැනුමක් ලෝකයේ වෙනත් කිසිම තැනක සඳහන් නොවන බව මේ පිළිබඳ කරුණු හදාරා ඇති උගතුන්ගේ මතය වෙයි. ථෙරවාදයේ වෙනත් රටක හෝ මහායානයේ, තන්ත්‍රයානයේ හෝ වෙනත් කිසිම තැනක හෝ නොමැති මේ දැනුමෙන් ප්‍රකාශවනුයේ සිංහල භික්ෂූන් වහන්සේගේ නිර්මාණශීලීත්වය ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva